සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

21 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය ............................ ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න. (පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)**

01. සාර්ව ආර්ථික විද්‍යාවේදී අධ්‍යයනය කෙරෙන ඒකක සඳහා නිදසුනක් නොවන්නේ,
    1. සමස්ත නිමැවුම් මට්ටම
    2. ව්‍යාපාර ආයතනයක වෙළඳපොල ක්‍රියාකාරිත්වය.
    3. ආර්ථික උත්පාත හා අවපාත
    4. විරැකියා මට්ටම
    5. ආර්ථික පසුබෑසීම

02. ආර්ථිකයක ප්‍රධානතම කාර්යභාරය වනුයේ,
    1. නිෂ්පාදන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
    2. මිනිස් වුවමනාවන් තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රවාහයක් බිහි කිරීම.
    3. ආදායම් ව්‍යාප්තියේ විෂමතාව හැකිතාක් අවම කිරීම.
    4. ආර්ථික ස්ථායිතාව පවත්වාගෙන යාම
    5. අඩු සම්පත් පිරිවැයක් යටතේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.

03. මිනිසාට ධන උපයෝගීතාවක් ලබාදෙන්නට සමත් වන්නා වූ ඕනෑම දෙයක් පුළුල් ලෙස සැලකිල්ලට ගත් විට එය හැඳින්විය හැක්කේ,
    1. නිෂ්පාදන සම්පත් ලෙස
    2. ආර්ථික සම්පත් ලෙස
    3. භාණ්ඩයක් ලෙස
    4. ආර්ථික භාණ්ඩයක් ලෙස
    5. නිෂ්පාදනය ලෙස

04. ආර්ථික සම්පත්වලට මිලක් පැවතීමට හේතුව වන්නේ,
    1. ආවස්ථික පිරිවැයක් පැවතීම
    2. නිෂ්පාදන කාර්යයට යොදාගත හැකිවීම
    3. හිඟකමක් පැවතීම
    4. සම්පාදනය දුෂ්කර වීම.
    5. විකල්ප භාවිත පැවතීම

05. මුද්‍රණාලයක දක්නට ලැබෙන පහත දෑ අතුරින් නිෂ්පාදන සාධකයක් ලෙස සැලකිය නොහැක්කේ කුමක්ද?
    1. මුද්‍රණ යන්ත්‍ර
    2. භාවිත නොකළ තීන්ත හා කඩදාසි
    3. මුද්‍රණාල ගොඩනැගිල්ල
    4. මුද්‍රණ කළමනාකරුගේ සේවා මුරය
    5. සේවා කාර්යක්ෂමතාව

06. පහත සඳහන් සම්පත් අතුරින් ස්වභාවික සම්පත් ලෙස නොසැලකෙන්නේ කුමක්ද?
    1. දැදුරු ඔය ජලාශය
    2. සිංහරාජ වනාන්තරය
    3. වන සතුන්
    4. සමනල කන්ද
    5. මහවැලි ගඟ

07. සාධක ඵලදායිතා වර්ධනය යන සංකල්පය සමග සැසඳෙන ප්‍රකාශය තෝරන්න.

1. යෙදවුම් හා නිමැවුම් අතර අනුලෝම සම්බන්ධතාවයයි.
2. අඩු යෙදවුම් ප්‍රමාණයකින් වැඩි නිමැවුමක් ලබාදීමයි.
3. යම් නිෂ්පාදන ක්‍රියාවලියක මුළු නිමැවුමයි.
4. යෙදවුම් නිමවුමට ඇති කරන දායකත්වයයි.
5. යෙදවුම් නිමැවුම් අතර පවත්නා ප්‍රතිලෝම සම්බන්ධතාවයයි.

08. ස්ථාවර ප්‍රාග්ධනයේ ප්‍රධාන සංරචක ලෙස නිෂ්පාදනයට ආධාර කෙරෙන මූර්ත වත්කම් දැක්විය හැකිය. මෙයින් බුද්ධිමය දේපළ වත්කමක් වන්නේ,

1. උදළු හා කැති
2. පරිගණක
3. ගල් අඟුරු බලාගාර
4. පරිගණක මෘදුකාංග
5. ගුවන්තොටුපොළ හා වරාය

09. සම්පත් පූර්ණ නිෂ්පාදනයක් ලබා නොදෙන අයුරින් භාවිත කිරීම හෙවත් උපරිම හැකියාවට වඩා අඩුවෙන් නිෂ්පාදනයට දායක වීම හඳුන්වන්නේ,

1. නිෂ්පාදන කාර්යක්ෂමතාවයයි.
2 සේවා වියුත්තියයි.
3. පූර්ණ සේවා නියුක්තියයි.
4. ඌණ සේවා නියුක්තියයි
5. සම්පත් අව භාවිත යයි.

10. ආර්ථිකයක සම්පත් බෙදීයාමේ ගැටළුව මගින් අදහස් වන්නේ,

1. ආදායම් ව්‍යාප්තියේ විෂමතාවයයි.
2. කාර්යක්ෂම සම්පත් භාවිතයේ අවශ්‍යතාවයි.
3. සම්පත් හිඟකම පිළිබඳ ගැටලුවයි.
4. කවර භාණ්ඩ හා සේවා නිපදවිය යුතුද? යන්න තීරණය කිරීම
5. අඩු ආදායම්ලාභීන්ට හිතකර ආදායම් ව්‍යාප්තියක අවශ්‍යතාවයි.

11. මෙම ප්‍රකාශ අතුරින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. වර්තමානයේ ආර්ථිකය තම හිඟ සම්පත් භාවිත කරන ආකාරය මත එම ආර්ථිකයට උරුම වන අනාගත සම්පත් සම්භාරය තීරණය වනු ඇත.
2. වර්තමාන, පරිභෝජනය කැප කිරීමට හැකියාවක් නොමැති කිසියම් රටකට වෙනත් කිසියම් මාර්ගයකින් වේගවත් ආර්ථික වෘද්ධියක් කරා ළඟා විය නොහැක.
3. ආර්ථිකයේ සම්පත් සම්භාරය හා ඵලදායිතාව වෙනස්වීම හේතුවෙන් එම ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව නැතහොත් නිෂ්පාදන හැකියාව වෙනස්වේ.
4. ආර්ථිකයක නිෂ්පාදන හැකියාව එහි සම්පත් සම්භාරය හා සාධක ඵලදායිතාවය මත තීරණය වේ.
5. සම්පත් සම්භාරය වැඩිවීම හේතුවෙන් ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව වැඩිවී නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වේ.

12. පහත දැක්වෙන්නේ ආර්ථික පද්ධති පිළිබඳව ප්‍රකාශ කිහිපයකි.

A - දේපළ පිළිබඳ පෞද්ගලික හිමිකම
B - සමාජ ශුභ සාධනය මත කටයුතු කිරීම
C - තරඟකාරී වෙළඳපොළ තත්ත්ව
D - මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සැලසුම් ක්‍රියාවලිය යොදාගැනීම.
E - පොදු යහපත සඳහා කටයුතු කිරීම.

ඉහත ප්‍රකාශ අතුරින් විධාන අර්ථ ක්‍රමයක ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. A,B,C
2. B,C,E
3. A,B,D
4. B,D,E
5. B,C,D

13. වෙළඳපොළ ආර්ථිකයක කා සඳහා නිෂ්පාදනය කරන්නේද? යන ප්‍රශ්නය විසඳාගනු ලබන්නේ,

1. සැලසුම් කිරීම මගිනි.
2. සාධක වෙළඳ පොළ ක්‍රියාකාරීත්වය මතය.
3. කුටුම්භ ලබන වැටුප් ආදායම් පදනම් කරගෙනය.
4. භාණ්ඩ හා සේවා වලට තීරණය වී ඇති මිල මගිනි.
5. සාපේක්ෂ ලාභය පදනම් කරගෙනය.


14. මෙයින් සමාජීය වෙළඳපොළ ආර්ථික පද්ධති පවතින රටවල් සඳහා නිදසුනක් නොවන්නේ,

1. නෝර්වේ. 2. ජර්මනිය 3. හංගේරියාව 4. පින්ලන්තය 5. ස්විඩනය

15. ''නූතන ආර්ථිකයන්හි වර්ධනය වෙමින් පවතින රාජ්‍ය නොවන සංවිධාන වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.'' පහත කාර්ය භාරයන් අතරින් රාජ්‍ය නොවන සංවිධාන ඉටුකරන කාර්යය භාරයක් නොවන්නේ මින් කුමක්ද?

1. දිළිඳුකම තුරන් කිරීම
2. පරිසර සංරක්ෂණය
3. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
4. ස්වාභාවික ආපදා තත්ත්වයන්හීදි අවතැන් වූ ජනතාවගේ සුභ සාධනය වෙනුවෙන් කටයුතු කිරීම.
5. කර්මාන්ත හා ව්‍යාපාර නියාමනය කිරීම.

16. පහත දැක්වෙන්නේ X හා Y භාණ්ඩ දෙක පමණක් නිපදවන එක්තරා ආර්ථිකයක නිෂ්පාදන සංයෝග ලක්ෂ්‍යයන් දැක්වෙන නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකි.





මෙහි A ලක්ෂ්‍යයේ සිට මායිම මතට ගමන් කිරීමේදී ආවස්ථික පිරිවැය ශුන්‍ය වුවද X හා Y යන භාණ්ඩ වර්ග දෙකෙහිම නිෂ්පාදනය වැඩිවන්නේ,

1. A සිට B වෙත ගමන් කළ විටය
2. A සිට B හා D වෙතට ගමන් කරන විටය.
3. A සිට C වෙත ගමන් කළ විටය
4. A සිට B හරහා C වෙත ගමන් කළ විටය.
5. A සිට D ට ගමන් කළ විටය.

17. සෑම රටකටම පොදු මූලික ආර්ථික ප්‍රශ්නයක් වන්නේ,

1. විශාල මුදල් ප්‍රමාණයක් සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹා යාමයි.
2. හිඟ ස්වභාවික සම්පත් අධික ලෙස ප්‍රයෝජනයට ගැනීමයි.
3. පරිසරය දූෂණය වීමයි.
4. අසීමිත වුවමනාවන් සපුරා ගැනීමට සම්පත් හිඟකම බාධාවක් වීමයි.
5. දරිද්‍රතාවය වැඩිවීමයි.

18. ඉරිගු සහ තිරිඟු නිෂ්පාදනය කරන ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත නිෂ්පාදන හැකියා මායිම ඔබට සපයා දී ඇත.





ඉහත නිෂ්පාදන හැකියා මායිම අනුව R ලක්ෂයේ සිට S ලක්ෂ්‍යට ගමන් කිරිමට හේතුව වූයේ,

1. තිරිඟු නිෂ්පාදනයේ ඵලදායිතාවය වැඩි වුවත් එය ඉරිගු නිෂ්පාදනය වැඩිවීම සඳහා බලපා නැති අවස්ථාවක්.
2. තිරිගු නිෂ්පාදනයේ තාක්‍ෂණික දියුණුවක් සිදුවීම නිසා එම අංශයේ විරැකියාවක් ඇති වූ අතර, එමගින් ඉරිගු නිෂ්පාදනය සම්බන්ධයෙන් කිසිදු බලපෑමක් සිදු නොවීම.
3. ඉරිගු සහ තිරිගු නිෂ්පාදනයේදී අකාර්යක්‍ෂමතාවයක් ඇතිවීම.
4. කර්මාන්ත දෙකෙහිම නිෂ්පාදනය වැඩිවීම.
5. තිරිගු නිෂ්පාදනයට හොඳ අස්වැන්නක් ලබාදෙන බීජ වර්ග හඳුන්වා දීමෙන් පසුව තිරිගු නිෂ්පාදනයේ ඉහළ යාමක්

19. පහත ප්‍රකාශවලින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. ආර්ථිකයක පවත්නා සියලුම සම්පත් ඵලදායි ලෙස නිෂ්පාදන ක්‍රියාවලියක සේවා නියුක්ත කරවීම පූර්ණ සේවා නියුක්තියයි.
2. සම්පත් උපරිම ඵලදායිතාවක් නොලැබෙන ආකාරයෙන් සම්පත් සේවා නියුක්ත කරවීම ඌණ සේවා නියුක්තියයි.
3. භාණ්ඩ හා සේවා සඳහා ආර්ථිකයේ ඉල්ලුම අඩුවීම හේතුවෙන් නිෂ්පාදනය පහළයාම ආර්ථික පසු බැසීමකි.
4. ආර්ථික අවපාතයක දිගු කාලීන තත්ත්වය ආර්ථික පසුබැසීම වශයෙන් හඳුන්වයි.
5. ආර්ථිකයක මූර්ත නිෂ්පාදනය අඛණ්ඩව දිගු කාලයක් ඉහළයාම ආර්ථික වර්ධනයයි.

20. X නම් පාරිභෝගිකයාගේ ඉල්ලුම් වක්‍රය පහත පරිදි වේ.




මෙම පාරිභෝගිකයා සිය ඉල්ලුම් වක්‍රයේ R ලක්ෂයේ සිට S ලක්ෂ්‍ය වෙත ගමන් කිරීමට නම්,

1. පාරිභෝගික රුචිය අඩුවිය යුතුය.
2. ආදේශන භාණ්ඩ මිල පහළ යා යුතුය.
3. යෙදවුම් මිල පහළ යාමක් විය යුතුය.
4. ආදායම ඉහළ යාමක් විය යුතුය.
5. ඉල්ලුම ඉහළ යාමක් විය යුතුය.

21. තරගකාරී වෙළඳපලක අලෙවිවන එක්තරා භාණ්ඩයක අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 20-P$

$Qs = -8+6P$

මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය පිළිවෙලින් දැක්වෙන්නේ,

| | | |
|---|---|---|
| 1. | සමතුලිත මිල 4 යි | සමතුලිත ප්‍රමාණය 16 යි |
| 2. | සමතුලිත මිල 4 යි | ප්‍රමාණය 28 යි |
| 3. | මිල 16 යි | ප්‍රමාණය 4 යි |
| 4. | මිල 7 යි | ප්‍රමාණය 28 යි |
| 5. | මිල 4 යි | ප්‍රමාණය 7 යි |

22. පහත ඉල්ලුම් ලේඛනයට අදාළ ඉල්ලුම් සමීකරණය වන්නේ,

| මිල (P) | ඉල්ලුම් ප්‍රමාණය (Qd) |
|---|---|
| 15 | 100 |
| 25 | 60 |

1. $Qd = 4 – 160 P$
2. $Qd = 160 – 40 P$
3. $Qd = 160 – 10 P$
4. $Qd = 160 – 4 P$
5. $Qd = 40 – 4 P$

23. මෙයින් සාධක සේවා වෙළඳපොළ තුළ සිදු නොවන ලක්ෂණයක් වන්නේ,

1. සාධක සේවා හුවමාරුවෙයි.
2. නිෂ්පාදන ආයතන භාණ්ඩ හා සේවා සපයයි.
3. නිෂ්පාදන ආයතන සාධක සේවා ඉල්ලුම් කරයි.
4. නිෂ්පාදන ආයතන වලට සාධක සේවා සපයන්නේ කුටුම්භ අංශයයි.
5. සාධක සේවා සඳහා ව්‍යුත්පන්න ඉල්ලුමක් පවතී.

24. $Qs = 4P$ $Qd = 120 - 6P$

මෙම තොරතුරු අනුව සමතුලිතයේදී ආර්ථික අතිරික්තය වන්නේ,

1. රුපියල් 192 යි
2. රුපියල් 128 යි
3. රුපියල් 480 යි
4. රුපියල් 960 යි
5. රුපියල් 384 යි

25. X භාණ්ඩයේ මිල 10% කින් ඉහළ ගිය විට X හි පාරිභෝගික පැහැදම 8% කින් ඉහළ ගියේය. මේ අනුව X භාණ්ඩය,

1. නම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩයකි.
2. අනම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩයකි.
3. ඒකීය නම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩයකි.
4. පූර්ණ අනම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩයකි.
5. පූර්ණ නම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩයකි.

26. ඉහළ සිට පහළට බෑවුම්වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක මධ්‍ය ලක්ෂ්‍යය සම්බන්ධයෙන් ඔබ එකඟවන පිළිතුර කුමක්ද?

| | නම්‍යතා සංගුණකය | ව්‍යාපාරික ආයභාරය |
|---|---|---|
| 1. | ඒකීය වේ. | ඉහළ යයි. |
| 2. | ඒකීය වේ. | උපරිම වේ. |
| 3. | ශුන්‍ය වේ. | පහළ යයි. |
| 4. | එකට අඩුවේ. | පහළ යයි. |
| 5. | එකට වැඩි වේ. | උපරිම වේ. |

27. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් නම්‍යතාව -2 ක් ද සැපයුම් නම්‍යතාවය 0.5 ක් ද වේ යැයි උපකල්පනය කරන්න. **හිස්තැනට** අදාළ ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

| P | Qd | Qs |
|---|---|---|
| 10 | 150 | 40 |
| 9 | .................. | .................... |

1. 120 හා 140
2. 120 හා 38
3. 142 හා 120
4. 120 හා 42
5. 180 හා38

28. මතු දැක්වෙන දත්ත ඔබට සපයා ඇත.

| භාණ්ඩය | මිලෙහි ප්‍රතිශත වෙනස | ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශත වෙනස |
|---|---|---|
| එළවළු | 30 | 12 |
| සිගරට් | 10 | 20 |
| කමිස | 00 | 10 |

ඒ ඒ භාණ්ඩයේ නම්‍යතා සංගුණකයට අනුව ඉල්ලුමේ මිල නම්‍යතාව පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. නම්‍ය / නම්‍ය / අනම්‍ය වේ.
2. නම්‍ය / අනම්‍ය / නම්‍යය වේ.
3. අනම්‍ය / නම්‍ය/ අනම්‍ය වේ.
4. ඒකීය නම්‍ය / නම්‍ය / අනම්‍ය වේ.
5. අනම්‍ය / නම්‍යය/ පූර්ණ නම්‍ය වේ.

29. බාල භාණ්ඩයක මිල අඩුවීමේදී එමගින් මිලදී ගනු ලබන ප්‍රමාණය වැඩිවීමට හේතුව නම්,

1. සෘණ ආදේශන ප්‍රති විපාකය සහ ශුන්‍ය ආදායම් ප්‍රතිවිපාකය.
2. සෘණ ආදායම් ප්‍රති විපාකයට වඩා බලවත් සෘණ ආදේශන ප්‍රතිවිපාකයක් පැවතීම.
3. සෘණ ආදේශන ප්‍රති විපාකයට වඩා බලවත් සෘණ ආදායම් ප්‍රතිවිපාකයක් පැවතීම.
4. අදේශන ප්‍රති විපාකය සෘණ වීම සහ ආදායම් ප්‍රතිවිපාකය ධන වීම.
5. ආදායම් හා ආදේශන යන ප්‍රතිවිපාක දෙකම සෘණ වීම.

30. X භාණ්ඩයේ මිල අඩු වූ විට ආදේශන ප්‍රතිවිපාකය -20 ක් වූ අතර ආදායම් ප්‍රතිවිපාකය - 30 ක් විය. මේ අනුව X භාණ්ඩය.

1. සාමාන්‍ය භාණ්ඩයකි.
2. බාල භාණ්ඩයකි.
3. ගිෆන් භාණ්ඩ
4. ආදේශන භාණ්ඩයකි.
5. අනුපූරක භාණ්ඩයකි.

31. X භාණ්ඩය සඳහා වන සැපයුම් ශ්‍රිතය $Qs = -40 + 20P$ වේ. මෙම භාණ්ඩයේ නිමැවුම් ඒකකයක් මත රු. 2 ක බද්දක් පනවනු ලැබුවහොත් බද්දෙන් පසු X භාණ්ඩ ඒකක 40 ක් සපයන මිල කොපමණද?

1. රු. 2
2. රු. 4
3. රු. 6
4. රු. 8
5. රු. 10

32. අත්‍යවශ්‍ය භාණ්ඩ මත විශේෂිත බද්දක් අයකිරීම නිසා හටගනු ලබන ආර්ථික ප්‍රතිවිපාකයකි.

1. ආර්ථික අතිරික්තය වැඩිවීම.
2. පාරිභෝගික අතිරික්තය වැඩිවීම.
3. සම්පත් බෙදා වෙන්කිරීම කාර්යක්ෂම වීම
4. සමාජයට අතිරේක බරක් දරන්නට සිදුවීම.
5. භාණ්ඩය නිපදවීම සඳහා අධි ආයෝජන තත්ත්වයක් හට ගැනීම.

33. කිසියම් පාරිභෝගික භාණ්ඩයක් නිෂ්පාදනය මත, රු. 20 ක ඒකක බද්දක් පනවන්නේ යැයි සලකන්න. ඒකක බද්දෙන් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදකයාට දරන්නට සිදුවන්නේ පහත සඳහන් කවර තත්ත්වයන් යටතේද?

| | භාණ්ඩය සඳහා පවතින ඉල්ලුමේ මිල නම්‍යතාව | භාණ්ඩය සඳහා පවතින සැපයුමේ මිල නම්‍යතාව |
|---|---|---|
| 1. | නම්‍ය | නම්‍ය |
| 2. | නම්‍ය | අනම්‍ය |
| 3. | අනම්‍ය | නම්‍ය |
| 4. | පූර්ණ අනම්‍ය | පූර්ණ අනම්‍ය |
| 5. | අනම්‍ය | පූර්ණ නම්‍ය |


34. දේශීය කිරිපිටි සඳහා පවතින වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත වගුවේ පෙන්නුම් කරයි.

| 100 g ට පැකට්ටුවක මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 80 | 500 | 900 |
| 70 | 600 | 800 |
| 60 | 700 | 700 |
| 50 | 800 | 600 |
| 40 | 900 | 500 |

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් ආණ්ඩුව විසින් ඒකක සහනාධාරයක් නිෂ්පාදකයින් වෙත ලබාදුන් අතර, සහනාධාරයෙන් පසු කිරිපිට පැකට් 1 ක වෙළෙඳපොළ මිල රු. 50 ක් නම් ඒකක සහනාධාරයේ ප්‍රමාණය,

1. රු. 4 කි  2. රු. 5 කි  3. රු. 10 කි  4. රු. 15 කි  5. රු. 20 කි

35. කිලෝ ග්‍රෑමයකට රු. 20 ක් බැගින් වූ සහනාධාරයක් ලබාදීමෙන් පසු සහල් වෙළෙඳපොළක ඉල්ලුම් හා සැපයුම් තත්ත්ව පහත රූපසටහන නිරූපනය කරයි.




සහනාධාරයෙන් පසු නිෂ්පාදකයාගේ අයභාරය හා නිෂ්පාදක අතිරික්තය කොපමණද?

| | නිෂ්පාදක අයභාරය (රු.) | නිෂ්පාදක අතිරික්ය (රු.) |
|---|---|---|
| 1. | 3800 | 400 |
| 2. | 2100 | 900 |
| 3. | 3000 | 900 |
| 4. | 1800 | 900 |
| 5. | 1600 | 400 |

36. අර්තාපල් සඳහා දේශීය වෙළඳපොලේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් තත්ත්ව පහත සමීකරණ පෙන්නුම් කරයි.

$Qd = 400 - 4P \qquad Qs = -100 + 6P$

අර්තාපල් ඒකකයක ලෝක වෙළඳපොළ මිල රු. 40 ක් වන අතර, අර්තාපල් වෙළඳපොළ ජාත්‍යන්තර වෙළඳාමට විවෘත වන තත්ත්වයක් යටතේ අර්තපල් සඳහා දේශීය ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණයන් පිළිවෙලින්,

1. ඒකක 240, 240  2. ඒකක 240, 140  3. ඒකක 100, 140
4. ඒකක 200, 200  5. ඒකක 140, 100


37. සඵල අවම මිල ප්‍රතිපත්තිය ඉවත් කරනු ලැබුවහොත්,

1. භාණ්ඩයේ මිල පහළ යයි.  2. භාණ්ඩයේ මිල ඉහළ යයි.
3. පාරිභෝගික අතිරික්තය අඩුවේ.  4. නිෂ්පාදක අතිරික්තය වැඩිවේ.
5. අලෙවි ප්‍රමාණය නොවෙනස්ව පවතී.

38. රජය භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කිරීම නිසා,

1. අධි සැපයුමක් ඇතිවේ.  2. මිල යන්ත්‍රණය මගින් භාණ්ඩ බෙදා හැරේ.
3. නිෂ්පාදක අතිරික්තය වැඩිවේ.  4. අධි ඉල්ලුමක් ඇතිවේ.
5. ආණ්ඩුවේ වියදම් ඉහළ යයි.

39. පහත රූප සටහනින් දැක්වෙන්නේ කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා වන වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍රයන්ය.




ආණ්ඩුව විසින් හඳුන්වා දුන් කිලෝ ග්‍රෑමයකට රු. 50 ක් වූ අවම මිල සහතික කිරීම සඳහා මිල ආධාරක ප්‍රතිපත්තියක් වශයෙන් ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය ක්‍රියාවට නංවයි නම්, ඒකකයට පාරිභෝගිකයා ගෙවන මිල සහ ඒකකයකට රජය දරන පිරිවැය පිළිවෙලින්,

1. රු. 30 සහ රු. 20
2. රු. 30 සහ රු. 200
3. රු. 50 සහ රු. 4
4. රු. 30 සහ රු. 50
5. රු. 40 සහ රු. 30

40. ගොවීන්ගේ ආදායම් අස්ථායී වීමට ප්‍රධාන හේතුවක් වන්නේ කෘෂි භාණ්ඩ සඳහා,
1. නම්‍ය ඉල්ලුමක් හා නම්‍ය සැපයුමක් පැවතීම යි.
2. නම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක් පැවතීම යි.
3. අනම්‍ය ඉල්ලුමක් හා නම්‍ය සැපයුමක් පැවතීම යි.
4. පූර්ණ නම්‍ය ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් පැවතීම යි.
5. අනම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක් පැවතීම යි.

41. හීනවන ආන්තික ඵල ලබන විට නිෂ්පාදන ආයතනයක,
1. මුළු ඵලදාව පහළ යයි.
2. මුළු පිරිවැය පහළ යයි
3. සාමාන්‍ය ස්ථාවර පිරිවැය ඉහළ නගී
4. ආන්තික නිමැවුම ඉහළ නගී
5. ආන්තික පිරිවැය ඉහළ නගී

42. සියළුම යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනයේ නිරත ආයතනයක නිමැවුම හැසිරෙන ආකාරය නිරූපණය වන්නේ,
1. හීනවන ආන්තික ඵල නීතිය මගිනි.
2. හීනවන පරිමාණානුකූල ඵල නීතිය මගිනි.
3. පරිමාණානුකූල ඵල නීතිය මගිනි.
4. පරිමාණානුකූල නොපිරිමැසුම් මගිනි.
5. වැඩෙන පරිමාණානුකූල ඵල නීතිය මගිනි

43. ව්‍යංග පිරිවැයට අයත් නොවන සංරචකය මින් කුමක්ද?
1. ප්‍රමාණික ලාභ
2. අති ප්‍රමාණික ලාභ
3. අහිමි වූ වැටුප් ආදායම
4. ආර්ථික ක්ෂයවීම්
5. අහිමි වූ පොලී ආදායම

44. සේවිකාවන් 5 දෙනෙකුගෙන් සැදුම්ලත් ඇඟලුම් නිෂ්පාදන ආයතනයක වර්ෂයක් තුළ දැරීමට සිදුවූ පිරිවැය ලැයිස්තුවක් පහත දැක්වේ.

A - සේවිකාවන්ට ගෙවූ වැටුප්
B - අමුද්‍රව්‍ය වියදම
C - රක්ෂණ වාරික ගෙවීම්
D - අලෙවිකරණ පිරිවැය
E - බැංකු ණය සඳහා පොලී ගෙවීම්

ඉහත පිරිවැය වර්ග අතුරෙන් ස්ථාවර පිරිවැයට අයත් වන්නේ,

1. D හා E
2. C,D හා E
3. A හා C
4. C හා E
5. A,B හා E

45. ආර්ථික විද්‍යාඥයෙකු විසින් කිසියම් නිෂ්පාදන ආයතනයක වාර්ෂික නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී සැලකිය යුතු ප්‍රමාණයක ආරෝපිත පිරිවැයක් පවතින බවට තහවුරු විය. මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශනයක් නිවැරදි වේද?
1. ඍජු පිරිවැය වක්‍ර පිරිවැයට වඩා විශාල වේ.
2. වක්‍ර පිරිවැය ඍජු පිරිවැයට වඩා විශාල වේ.
3. ගණකාධිකාරී ලාභ ආර්ථික ලාභ වලට වඩා විශාල වේ.
4. ගණකාධිකාරී පිරිවැය ආර්ථික පිරිවැයට වඩා විශාල වේ.
5. ආර්ථික ලාභ ගණකාධිකාරී ලාභ ඉක්මවා යයි.

46. කෙටිකාලීන නිෂ්පාදනයේ නිරත කිසියම් ආයතනයක් විසින් ශ්‍රමිකයෙකුගේ දෛනික වැටුප රු. 800 සිට රු. 1000 දක්වා වැඩි කරන විට ආයතනයේ,

| | ආන්තික පිරිවැය | මුළු ස්ථාවර පිරිවැය | මුළු පිරිවැය |
|---|---|---|---|
| 1. | වැඩි වේ | ස්ථාවර වේ | වැඩි වේ |
| 2. | ස්ථාවර වේ | ස්ථාවර වේ | ස්ථාවර වේ |
| 3. | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| 4. | වැඩි වේ | අඩු වේ | වැඩි වේ |
| 5. | අඩු වේ | වැඩි වේ | අඩු වේ |


47. කෙටි කාලයේදී X භාණ්ඩය නිෂ්පාදනය කරන විට හටගන්නා මුළු පිරිවැය පිළිබඳ තොරතුරු පහත ලේඛනයෙහි දැක්වේ.

| X භාණ්ඩ (ඒකක) | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.) | 30 | 60 | 80 | 96 | 120 | 160 | 216 |

මෙම තොරතුරු වලට අනුව නිමැවුම් ඒකක 5 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය හා මුළු විචල්‍ය පිරිවැය කොපමණද?

| | AFC (රු.) | TVC (රු.) |
|---|---|---|
| 1. | 30 | 40 |
| 2. | 30 | 90 |
| 3. | 6 | 130 |
| 4. | 6 | 26 |
| 5. | 5 | 32 |

48. නිෂ්පාදන ආයතනයක කෙටිකාලීන පිරිවැය වක්‍ර රූප සටහනෙහි දැක්වේ.




ඉහත රූප සටහනට අනුව a,b දුරින් නිරූපණය වන්නේ, ඒකක 100 ක් නිෂ්පාදනය කරන විට හටගන්නා,

1. ආන්තික පිරිවැයයි
2. මුළු විචල්‍ය පිරිවැයයි.
3. සාමාන්‍ය මුළු පිරිවැයයි
4. සාමාන්‍ය ස්ථාවර පිරිවැයයි
5. සාමාන්‍ය විචල්‍ය පිරිවැයයි.

49. වෙනත් ආයතන ප්‍රවේශ වීම වළක්වාලමින් කිසියම් ආයතනයකට භාණ්ඩයක් නිපදවීම සම්බන්ධයෙන් ස්වභාවික ඒකාධිකාරයක් නිර්මාණය කර ගැනීමට හේතුවන්නේ එම ආයතනයේ,

1. ගිළුනු පිරිවැය විශාලවීම.
2. බලපත්‍ර හිමිකම
3. පරිමාණානුකූල පිරිමැසුම් පැවතීම.
4. අධි තාක්ෂණික උපකරණ භාවිතය
5. ප්‍රධාන අමුද්‍රව්‍ය පිළිබඳ හිමිකම

50. තම වෙළඳපොළ ප්‍රතිශතය මුළුමනින්ම අහිමි නොවන ලෙස වෙළඳපොළ මිල නියම කිරීමේ බලයක් පවතින වෙළඳපොළ තත්ත්වයන් හඳුනා ගන්න.

1. ඒකාධිකාරී හා අපූර්ණ තරග ආයතන
2. ඒකාධිකාරී හා පූර්ණ තරග ආයතන
3. අපූර්ණ තරගය හා කතිපයාධිකාරී ආයතන
4. ඒකාධිකාරී හා කතිපයාධිකාරී ආයතන
5. අපූර්ණ තරගය හා පූර්ණ තරග ආයතන

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

21 | S | II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

ආර්ථික විද්‍යාව II

කාලය පැය තුනයි
අමතර කාලය විනාඩි 10 යි.

❖ **''අ'' කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද ''ආ'' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## අ උප කොටස

01). i. නිෂ්පාදන සම්පත් හා ආර්ථික සම්පත් වෙන වෙනම නිර්වචනය කරන්න. (ලකුණු 4)

ii. ආර්ථික සම්පත් වල ප්‍රභේද දක්වා ඒවා වර්ග කොට දක්වන්න. (ලකුණු 4)

iii. ස්වභාවික සම්පත් අසීමිතව භාවිතයට ගැනීම නිසා ගෝලීය වශයෙන් පැන නගින ගැටලු 4 ක් දක්වන්න. (ලකුණු 4)

iv. රටක ප්‍රාග්ධනය බිහිවන්නේ ආයෝජනය තුළිනි. ආයෝජන කාර්යය සඳහා සම්පත් ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍ර කවරේද? (ලකුණු 4)

v. ඵලදායීතාවය යනුවෙන් කුමක් අදහස්වේද?
ඵලදායිතාවය තීරණය කරන සාධක මොනවාද? (ලකුණු 4)

02). i. පහත දැක්වෙන ආර්ථික සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර 4 ක් මගින් පැහැදිලි කරන්න.

අ) සම්පත් හිඟකම සහ විකල්ප ප්‍රයෝජන

ආ) නිෂ්පාදන කාර්යක්ෂමතාව

ඇ) පාරිභෝජනය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යොදවා ඇති ආර්ථිකයක ආර්ථික වෘද්ධිය.

ඈ) සම්පත් විනාශ වීමකින් තොරව රටක් ආර්ථික අවපාතයකට මුහුණදීම (2x4 ලකුණු 8)

ii. ආවස්ථික පිරිවැයේ සුවිශේෂතා 04 ක් දක්වන්න. (ලකුණු 4)

iii. පාරිභෝගික ස්වාධිපත්‍යය යනුවෙන් කුමක්ද අදහස්වේද? (ලකුණු 2)

iv. වෙළඳපොළ ආර්ථිකයක මිල ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ මොනවාද? (ලකුණු 3)

v. විධාන ආර්ථිකයක දක්නට ලැබෙන ප්‍රධාන දුර්වලතා 3 ක් නම් කරන්න. (ලකුණු 3)

03). i. විවිධ ආර්ථික පද්ධති වල දක්නට ලැබෙන සානුබල වල ස්වරූප 3 කි. ඒ මොනවාද? (ලකුණු 3)

ii. තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණයේ ස්වරූපය හා නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය යන නිර්ණායක මත ආර්ථික පද්ධති වර්ගකොට දක්වන්න. (ලකුණු 4)

iii. සමාජීයීය වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය හා සමාජවාදී වෙළෙඳපොල ආර්ථික පද්ධති අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත ස්ථාවර ආවස්ථික පිරිවැය සහ වැඩෙන ආවස්ථික පිරිවැය ඇතිවීමට බලපාන හේතු මොනවාද? (ලකුණු 4)

v. මතු දැක්වෙන ප්‍රකාශයන්ට එකඟ වන්නේද? නොවන්නේද? යන්න සඳහන් කරන්න.

- අ) වෙළඳපොල ආර්ථිකයක සියළු මිල ගණන් තිරණය වන්නේ ඉල්ලුම් හා සැපයුම් බලවේග මගිනි.
- ආ) සීමිත සැපයුමක් සහිත නිෂ්පාදන සම්පත් නොමිල සම්පත් නැතහොත් ආර්ථික නොවන සම්පත් වශයෙන් හැඳින්වේ.
- ඇ) විකල්ප නිෂ්පාදන ශිල්ප ක්‍රම අතරින් කුමන හෝ එක් නිෂ්පාදන ශිල්ප ක්‍රමයක් භාවිත කොට නිපදවීමක් සිදුවන නිසා කෙසේ නිෂ්පාදනය කළයුතුද යන මූලික ආර්ථික ප්‍රශ්නය නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය ලෙසින්ද දැක්වේ.
- ඉ) ආර්ථිකයක සම්පත් සම්භාරය අඩුවීම මගින් නිෂ්පාදන හැකියාව වැඩිවන අතර, නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වේ.
- ඊ) ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වන විට (MC = MB) නිෂ්පාදනයේ කාර්යක්‍ෂමතාව ඉටුවේ. (ලකුණු 1 x 5)

04). i. වෙළඳපොල සැපයුම් වක්‍රයක් ඇඳීමේදී ස්ථාවරව පවතියයි සලකනු ලබන සාධක කවරේද? (ලකුණු 4)

ii. වෙළඳපොල සමතුලිතයක ඇති කොන්දේසි 04 ක් දක්වන්න. (ලකුණු 4)

iii. පහත දැක්වෙන්නේ වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ 2 කි.

$Qd = 600 - 10P$ $Qs = 10P$

- අ) වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්තාර කඩදාසියක ඇඳ දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය ලකුණු කර දක්වන්න. (ලකුණු 2)
- ආ) සමතුලිත මිලේදී පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)
- ඇ) සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)
- ඈ) ප්‍රමාණය 200 දී අධි ඉල්ලුම් මිල කොපමණද? (ලකුණු 2)

iv. වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර විතැන් වීමෙන් වෙළඳපොල සමතුලිත මිල අඩුවිය හැකි අවස්ථා දෙකක් හා වැඩිවිය හැකි අවස්ථා දෙකක් දක්වන්න. (ලකුණු 4)

05). i. පහත සඳහන් අවස්ථාවලදී මුළු අයභාරය වැඩිවේද? අඩුවේද? නැතහොත් නොවෙනස්ව පවතී ද යන්න සඳහන් කරන්න.

- අ) අනම්‍ය ඉල්ලුමකදී මිල පහළ වැටීම
- ආ) නම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යාම
- ඇ) අනම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යාම
- ඈ) අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයක මිල අඩුවීම.
- ඉ) ඒකීය නම්‍ය ඉල්ලුමකදී මිල පහළ වැටීම (ලකුණු 1 x 5)

ii. තරගකාරී තේ වෙළඳපොළක් ඇසුරෙන් පහත සඳහන් සිදුවීම්වල ප්‍රතිවිපාක සුදුසු රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

- අ) දිලීර රෝගයක් හේතුකොට ගෙන තේ වතු විශාල ප්‍රමාණයක් විනාශ වීම.
- ආ) තේ සඳහා පාරිභෝගික අභිරුචිය අඩුවීම.
- ඇ) කෝපි වෙළඳපොළ මිල පහළ වැටීම.
- ඈ) තේ සඳහා දියුණු තාක්‍ෂණයක් හඳුන්වාදීම
- ඉ) තේ වතු හිමියන් ලබාගත් වගාණය කපා හැරීම (ලකුණු 2 x 5)

iii. පාරිභෝගිකයන්ට, නිෂ්පාදකයන්ට ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රායෝගික වශයෙන් සැපයුම් නම්‍යතා සංකල්පය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

## ආ කොටස

06). සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සමීකරණ වලින් පෙන්නුම් කරයි.

$Qd = 300 – 10p$ $Qs = -100 + 10P$

i. මෙම වෙළඳපොලේ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

ii. රජය මෙම භාණ්ඩය මත ඒකකයකට රු. 4 ක් වන සේ දේශීය භාණ්ඩ බද්දක් නිෂ්පාදකයන් මත පනවනවා යැයි සිතන්න.

අ) බදු පැනවීමෙන් පසු පාරිභෝගික අතිරික්තය කොපමණද? (ලකුණු 2)

ආ) දේශීය භාණ්ඩ බද්දෙන් රජය එකතු කරනු ලබන අයභාරය කොපමණද? (ලකුණු 2)

ඉ) පාරිභෝගිකයා දරන මුළු බදු මුදල කොපමණද? (ලකුණු 2)

iii. ''බද්දක් අයකිරීම මෙම වෙළඳපොළේ සම්පත් බෙදාවෙන් කිරීමේ අකාර්යක්‍ෂමතා බිහි කරයි''. මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. ගැනුම්කරුවන් මත අලෙවි බද්දක් (ඒකක බදු) පැනවීමෙන් පසුව බදුබර බෙදීයන ආකාරය යෝග්‍ය ප්‍රස්ථාර සටහනකින් පෙන්වා දෙන්න. (ලකුණු 4)

v. නිෂ්පාදන සලාක නියම කිරීම යන්නෙන් කවරක් අදහස් වේද? සලාක නියම කිරිමේ අරමුණ කුමක්ද? (ලකුණු 4)

07). i. වෙළඳපොළ ක්‍රමයට මැදිහත් වී රජය විසින් සිදුකරන මිල පාලන ප්‍රතිපත්ති වල ස්වරූප පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. සඵල උපරිම මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 5)

iii. උපරිම මිල පාලනය වෙනුවට නිෂ්පාදනය කරනු ලබන සෑම භාණ්ඩ ඒකකයක් සඳහාම නිශ්චිත සහනාධාරයක් ලබා දෙන්නේ නම් සහනාධාරයෙන් පසු හටගන්නා ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 4)

iv. වෙළඳපොලේ අලෙවිවන කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා විශේෂිත නිෂ්පාදන සහනාධාරයක් ලබාදුන් විට සහනාධාරයේ මුළු වාසිය නිෂ්පාදකයාට හිමිවන්නේ කුමන සැපයුම් නම්‍යතා තත්ත්වයක් යටතේද? රූප සටහනකින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 3)

v. මූලික ආහාර ද්‍රව්‍ය වල මිල ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා තොග රැස් කිරීම හා බෙදා හැරීම සිදුකරයි. එහි වාසි අවාසි සඳහන් කරන්න. (ලකුණු 4)

08). තරඟකාරී වෙළඳපොළක අලෙවි වන X භාණ්ඩයේ වෙළඳපොළ සමතුලිත මිල හා එම මිලට අලෙවි වන සමතුලිත ප්‍රමාණය පිළිවෙලින් රු. 40 සහ ඒකක 80 කි. භාණ්ඩයේ මිල රු. 30 ක් වන විට උපරිම ඉල්ලුම් ප්‍රමාණය 100 ක් වන අතර, අවම සැපයුම් ප්‍රමාණය ඒකක 60 කි. රජය විසින් මෙම භාණ්ඩ ඒකකයකට රු. 50 ක් වන සේ අවම මිලක් නීතියෙන් නියම කර තිබේ යැයි සලකන්න.

i. මෙම තොරතුරු රූප සටහනකින් ඉදිරිපත් කරන්න. (ලකුණු 5)

ii. අවම මිල හඳුන්වා දීමෙන් පසු වෙළඳපොල තුළ හටගන්නා අධි සැපයුම් ප්‍රමාණය කොපමණද? (ලකුණු 2)

iii. අධි සැපයුම මිලදී ගැනීම මගින් අවම මිල පවත්වා ගෙන යාමට ආණ්ඩුව කටයුතු කරනු ලැබුවහොත් ආණ්ඩුවට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? (ලකුණු 2)

iv. අධි සැපයුම මිලදී ගැනීම වෙනුවට ඌන පූර්ණ ගෙවීම් ක්‍රමයක් යටතේ අවම මිල සහතික කරයි නම් ඒකකයක් වෙනුවෙන් රජය දරන පිරිවැය කොපමණ වේද? (ලකුණු 2)

v. අවම මිල සහතික කිරීම සඳහා ආණ්ඩුව විසින් ගනු ලබන ඉහත සඳහන් මිල ආධාරක ස්වරූප දෙකෙන් සමාජ ශුභ සාධනයට වැඩිම අහිතකර බලපෑමක් ඇතිකරන්නේ කුමන ස්වරූපය මගින්ද? ඔබේ රූප සටහන ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 5)

vi. ගොවීන්ගේ ආදායම් ස්ථාවරත්වයට පත් කිරිම සඳහා රජයකට ගතහැකි ක්‍රියාමාර්ග කවරේද? (ලකුණු 4)

09). i. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය හඳුන්වාන්න. (ලකුණු 4)

ii. ආයතනයක දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහළ බැසීමට බලපාන හේතු කවරේද? (ලකුණු 4)

iii. කෙටි කාලයෙහි නිෂ්පාදනයේ නිරත වී සිටින ආයතනයක නිමැවුම ප්‍රසාරණය කරන විට සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍ර හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. නිශ්චිත දිනකට, කිසියම් නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන පිරිවැය හා අයභාරය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අයිතමය | රුපියල් |
|---|---|
| ආයතනයේ අයභාරය | 24000 |
| වැටුප් හා වේතන | 15000 |
| අමුද්‍රව්‍ය වියදම | 4000 |
| ආර්ථික ක්ෂය වීම් | 200 |
| රක්ෂණ වාරිකය | 100 |
| බදු කුලිය | 1000 |
| බැංකු ණය සඳහා පොලී ගෙවීම් | 1200 |
| හිමිකරු යොදන ලද ප්‍රාග්ධනයෙහි අහිමි වූ පොලී | 500 |
| අහිමි වූ වැටුප් ආදායම | 800 |

මෙම තොරතුරු වලට අනුව මෙම ආයතනයේ අදාළ දිනයේ දී,

අ) ඍජු පිරිවැය ගණනය කරන්න.

ආ) මුළු ආවස්ථික පිරිවැය කොපමණද?

ඉ) ගණකාධිකාරී ලාභය කොපමණ වේද?

උ) ආර්ථික ලාභය ගණනය කරන්න. (ල.2 බැගින් මුළු ල.8)

10). i. නිෂ්පාදන ආයතනයක් කෙටිකාලයේදී ලබන ඵල නිර්වචනය කරන්න. ඒ සඳහා පදනම් කරගන්නා උපකල්පන කවරේද? (ලකුණු 4)

ii. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ මුළු නිමැවුම, සාමාන්‍ය නිමැවුම හා ආන්තික නිමැවුම අතර කවර සබඳතාවක් පවතින්නේද? යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 4)

iii. පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමාණුකූල නොපිරිමැසුම් යනු කවරේද? (ලකුණු 4)

iv. වෙළෙඳපොළ ආකෘති අතර විවිධත්වයක් ගැනීම කෙරෙහි බලපාන සාධක සඳහන් කරන්න. (ලකුණු 4)

v. අවශේෂ වෙළඳපොළ ව්‍යුහ හා සැසඳීමේදී පූර්ණ තරගකාරී ආයතනයේ ඉල්ලුම් වක්‍රයේ සුවිශේෂී හැඩය හා ඒ කෙරෙහි බලපා ඇති සාධක නම් කරන්න. (ලකුණු 4)

**2020 දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය**

# ආර්ථික විද්‍යාව

**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | 2 | 11) | 2 | 21) | 1 | 31) | 3 | 41) | 5 |
| 2) | 2 | 12) | 4 | 22) | 4 | 32) | 4 | 42) | 3 |
| 3) | 3 | 13) | 2 | 23) | 2 | 33) | 2 | 43) | 2 |
| 4) | 3 | 14) | 3 | 24) | 3 | 34) | 5 | 44) | 4 |
| 5) | 5 | 15) | 5 | 25) | 2 | 35) | 3 | 45) | 3 |
| 6) | 1 | 16) | 3 | 26) | 2 | 36) | 2 | 46) | 1 |
| 7) | 2 | 17) | 4 | 27) | 5 | 37) | 1 | 47) | 3 |
| 8) | 4 | 18) | 2 | 28) | 5 | 38) | 4 | 48) | 5 |
| 9) | 4 | 19 | 4 | 29) | 2 | 39) | 1 | 49) | 3 |
| 10) | 4 | 20 | 3 | 30) | 3 | 40) | 5 | 50) | 1 |

## II කොටස

**ආ කොටස**

---

**01). i. නිෂ්පාදන සම්පත් හා ආර්ථික සම්පත් වෙන වෙනම නිර්වචනය කරන්න. (ලකුණු 4)**

**ii. ආර්ථික සම්පත් වල ප්‍රභේද දක්වා ඒවා වර්ග කොට දක්වන්න. (ලකුණු 4)**

**iii. ස්වභාවික සම්පත් අසීමිතව භාවිතයට ගැනීම නිසා ගෝලීය වශයෙන් පැන නගින ගැටලු 4 ක් දක්වන්න. (ලකුණු 4)**

**iv. රටක ප්‍රාග්ධනය බිහිවන්නේ ආයෝජනය තුළිනි. ආයෝජන කාර්යය සඳහා සම්පත් ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍ර කවරේද? (ලකුණු 4)**

**v. ඵලදායීතාවය යනුවෙන් කුමක් අදහස්වේද? ඵලදායිතාවය තීරණය කරන සාධක මොනවාද? (ලකුණු 4)**

01). i.
- මිනිස් වුවමනා තෘප්තිමත් කර ගැනීමට අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට යොදාගන්නා දෑ නිෂ්පාදන සම්පත් නැතහොත් නිෂ්පාදන සාධක වශයෙන් හඳුන්වයි. (ල.1)
- නිෂ්පාදන සම්පත් අතුරින් සීමිත සැපයුමක් ඇති හිඟ සම්පත් ආර්ථික සම්පත් ලෙස හඳුන්වයි. (ල.1)
- නිෂ්පාදන සම්පත් යන්නට සීමාසහිත සැපයුමක් ඇති හිඟ සම්පත් මෙන්ම අසීමිත සැපයුමක් ඇති නොමිල සම්පත් ද අයත් වේ. (ල.1)
- ආර්ථික සම්පත් යන්නට ඇතුලත් වන්නේ සීමාසහිත සැපයුමක් ඇති හිඟ සම්පත් පමණි. (ල.1)

ii. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය (ල.2)
- දේපොළ සම්පත් - භූමිය , ප්‍රාග්ධනය
- මානව සම්පත් - ශ්‍රමය, ව්‍යවසායකත්වය (ලකුණු 2)

iii. - වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාම - ග්ලැසියර් දියවීම - ඕසෝන් ස්ථරය සිදුරුවීම
- ජල හිඟයකට මුහුණදීම - ගංවතුර සහ නායයෑම් ඇතිවීම (කරුණු 4 ට ලකුණු 4)

iv. - දේශීය ඉතුරුම් - කුටුම්බ ඉතුරුම් - ව්‍යාපාර ඉතුරුම් - රාජ්‍ය ඉතුරුම්
- විදේශ ඉතුරුම් - විදේශ ආයෝජන - විදේශ ආධාර - විදේශ ප්‍රදාන (ලකුණු 4)

v. - ඵලදායිතාව යනුවෙන් අදහස් වන්නේ යෙදවුම් ඒකකයකින් ලබාගතහැකි සාමාන්‍ය නිමවුම් ඒකක ප්‍රමාණයයි (ල.1)

සාධක ඵලදායිතාවය = නිමවුම් ප්‍රමාණය / යෙදවුම් ප්‍රමාණය (ල.1)

- තාක්ෂණය - කළමනාකරණය - මානව ප්‍රාග්ධනය - ශ්‍රම විභජනය හා විශේෂීකරණය (කරුණු 4 ට ලකුණු 2)

**02). i. පහත දැක්වෙන ආර්ථික සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර 4 ක් මගින් පැහැදිලි කරන්න.**

**අ) සම්පත් හිඟකම සහ විකල්ප ප්‍රයෝජන**

**ආ) නිෂ්පාදන කාර්යක්ෂමතාව**

**ඇ) පාරිභෝජනය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යොදවා ඇති ආර්ථිකයක ආර්ථික වෘද්ධිය.**

**ඈ) සම්පත් විනාශ වීමකින් තොරව රටක් ආර්ථික අවපාතයකට මුහුණදීම (2x4 ලකුණු 8)**


**ii. ආවස්ථික පිරිවැයේ සුවිශේෂතා 04 ක් දක්වන්න. (ලකුණු 4)**

**iii. පාරිභෝගික ස්වාධිපත්‍යය යනුවෙන් කුමක්ද අදහස්වේද? (ලකුණු 2)**

**iv. වෙළඳපොළ ආර්ථිකයක මිල ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ මොනවාද? (ලකුණු 3)**

**v. විධාන ආර්ථිකයක දක්නට ලැබෙන ප්‍රධාන දුර්වලතා 3 ක් නම් කරන්නත (ලකුණු 3)**


02). i. අ)




- ඉහත වක්‍රයේ විකල්ප නිමවුම් සංයෝස රාශියක් පවතී. B සහ A ලක්‍ෂ වලින් එම සංයෝජන දැක්වේ.
- C ලක්‍ෂයෙන් සම්පත් හිඟකම දැක්වේ.

(රූපසටහනට ල.1, පැහැදිලි කිරීමට ල.1)


ආ)




- මායිම මත A,B වැනි ලක්‍ෂවලින් නිෂ්පාදන කාර්යක්‍ෂමතාවය පෙන්නුම් කරයි.

(රූපසටහනට ල.1, පැහැදිලි කිරීමට ල.1)


ඇ)




- පාරිභෝජන භාණ්ඩ සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යොදවා ඇති බව A ලක්‍ෂායෙන් පෙන්නුම් කරන අතර එවැනි රටක ආර්ථික වෘද්ධිය මන්දගාමී වේ. වක්‍රය දකුණට මන්දගාමී ලෙස විතැන්වේ.

(රූපසටහනට ල.1, පැහැදිලි කිරීමට ල.1)

ඈ)




- සම්පත් විනාශ නොවී ආර්ථික අවපාතයක් වූ විට නිෂ්පාදන ස්ථානය A සිට B දක්වා ගමන් කරයි.

(රූපසටහනට ල.1, පැහැදිලි කිරීමට ල.1)

ii. - ආවස්ථික පිරිවැය පුද්ගල බද්ධ වේ. / ආත්මගත සංකල්පයකි.
- ආවස්ථික පිරිවැය ඍජු හා ආරෝපිත පිරිවැය යන දෙකොටසින්ම සමන්විත වේ.
- ආවස්ථික පිරිවැය ධන අගයන් ගනී - ආවස්ථික පිරිවැය මූර්ත සංකල්පය
- ආවස්ථික පිරිවැය ශූනය අගයන් ද ගනු ලැබේ. (කරුණු 4 ට ලකුණු 4)

iii. - වෙළෙඳපොළ ආර්ථිකයක අවසාන බලධාරියා වන්නේ පාරිභෝගිකයාය. වෙළඳපොළේ පාරිභෝගිකයා කරනු ලබන තේරීම් මත කවර භාණ්ඩ නිපදවනු ලබන්නේද යන්න තීරණය වේ. කවර කර්මාන්ත වෙළඳපොළේ රැඳී සිටීද යන්න පාරිභෝගික තීරණ මත තීරණය වේ. මෙම ලක්‍ෂණය පාරිභෝගික ස්වාධිපත්‍ය ලෙස හඳුන්වයි. පාරිභෝගික තීරණ වලට නිෂ්පාදකයා ප්‍රතිචාර දක්වන බැවින් පාරිභෝගිකයා වෙළඳපොළේ ප්‍රධාන තීරකයා ද වේ. (ලකුණු 2)

iv. - තොරතුරු හා සංඥා සැයීමේ කාර්යය. - සානු බල සැපයීමේ කාර්යය
- සම්පත් සලාකනය කිරීමේ කාර්යය (ලකුණු 3)

v. - සංවිධාන සහ සම්බන්ධීකරණ ගැටලු - තත්ත්ව පාලනයේ බිඳ වැටීම්
- සානු බල ප්‍රමාණවත් නොවීම - පරිසර හායනය
- තේරීම් කිරීමට ඇති පෞද්ගලික නිදහස සීමාවීම (කරුණු 3 කට ලකුණු 3)

**03). i.** **විවිධ ආර්ථික පද්ධති වල දක්නට ලැබෙන සානුබල වල ස්වරූප 3 කි. ඒ මොනවාද?** **(ලකුණු 3)**

**ii.** **තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණයේ ස්වරූපය හා නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය යන නිර්ණායක මත ආර්ථික පද්ධති වර්ගකොට දක්වන්න.** **(ලකුණු 4)**

**iii.** **සමාජීයීය වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය හා සමාජවාදී වෙළෙඳපොල ආර්ථික පද්ධති අතර වෙනස පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

**iv.** **නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත ස්ථාවර ආවස්ථික පිරිවැය සහ වැඩෙන ආවස්ථික පිරිවැය ඇතිවීමට බලපාන හේතු මොනවාද?** **(ලකුණු 4)**

**v.** **මතු දැක්වෙන ප්‍රකාශයන්ට එකඟ වන්නේද? නොවන්නේද? යන්න සඳහන් කරන්න.**

**අ)** **වෙළෙඳපොල ආර්ථිකයක සියළු මිල ගණන් තීරණය වන්නේ ඉල්ලුම් හා සැපයුම් බලවේග මගිනි.**

**ආ)** **සීමිත සැපයුමක් සහිත නිෂ්පාදන සම්පත් නොමිල සම්පත් නැතහොත් ආර්ථික නොවන සම්පත් වශයෙන් හැඳින්වේ.**

**ඇ)** **විකල්ප නිෂ්පාදන ශිල්ප ක්‍රම අතරින් කුමන හෝ එක් නිෂ්පාදන ශිල්ප ක්‍රමයක් භාවිත කොට නිපදවීමක් සිදුවන නිසා කෙසේ නිෂ්පාදනය කළයුතුද යන මූලික ආර්ථික ප්‍රශ්නය නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය ලෙසින්ද දැක්වේ.**

**ඉ)** **ආර්ථිකයක සම්පත් සම්භාරය අඩුවීම මගින් නිෂ්පාදන හැකියාව වැඩිවන අතර, නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වේ.**

**ඊ)** **ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වන විට (MC = MB) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව ඉටුවේ.**

**(ලකුණු 1 x 5)**

03). i. - ද්‍රව්‍යාත්මක ප්‍රතිලාභ සහිත සානුබල - සාදාචාරාත්මක සානුබල - බලය පදනම් කරගත් සානු බල (ල. 3)

ii. **නිෂ්පාදන සම්පත් හිමිකාරිත්වය** - ධනේශ්වර ආර්ථික පද්ධති - සමාජවාදී ආර්ථික පද්ධති (ලකුණු 2)

**තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය** - වෙළඳපොළ ආර්ථික පද්ධති - විධාන (සැලසුම්ගත) ආර්ථික පද්ධති - මිශ්‍ර ආර්ථික පද්ධති (ල.2)

iii.
- වෙළඳපොළ ආර්ථික පද්ධතියක් තුළ සමාජ සාධාරණත්වය දැඩිව අවධාරණය කෙරෙන ආර්ථික පද්ධති සමාජීය වෙළඳපොළ ආර්ථිකයයි. (ල.1)
- නිෂ්පාදන සම්පත් පෞද්ගලික අංශය සතු වුවද සම්පත් භාවිතය පිළිබඳ විශාල බලපෑමක් රජයෙන් සිදු කෙරේ. රජය එහි පුරවැසියන් වෙත සමාජ ආරක්ෂණ ජාලයක් සපයයි. (ල.1)
- සමාජවාදී වෙළඳපොළ ආර්ථිකයක් යනු මූලික වශයෙන් සමාජවාදී දර්ශනයන් මත මෙහෙය වන කිසියම් දුරකට වෙළඳපොළ බලවේග වලට ක්‍රියාත්මක වීමට ඉඩ සලසා ඇති ආර්ථික පද්ධතීන්ය.
- නිෂ්පාදන සම්පත් රජය සතුය. සම්පත් භාවිතය පිළිබඳ තීරණ ගැනීම පෞද්ගලික අංශය සතුවේ.(ලකුණු 2)

iv.

| ස්ථාවර ආවස්ථික පිරිවැය | වැඩෙන ආවස්ථික පිරිවැය |
|---|---|
| - සම්පත් සමජාතීය වීම | - සම්පත් සමජාතීය නොවීම |
| - එක් නිෂ්පාදනයක් සඳහා කාර්යක්ෂම වන සම්පත් අනෙක් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂම වීම | - එක් නිෂ්පාදනයක් සඳහා කාර්යක්ෂම වන සම්පත් අනෙක් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂම නොවීම. |

(ලකුණු 4)

v. අ) එකඟ විය නොහැක ආ) එකඟ විය නොහැක

ඇ) එකඟ විය හැක ඉ) එකඟ විය නොහැක

ඊ) එකඟ විය නොහැක (ලකුණු 1 x 5)

**04). i.** **වෙළඳපොල සැපයුම් වක්‍රයක් ඇඳීමේදී ස්ථාවරව පවතියැයි සලකනු ලබන සාධක කවරේද?** **(ලකුණු 4)**

**ii.** **වෙළඳපොල සමතුලිතයක ඇති කොන්දේසි 04 ක් දක්වන්න.** **(ලකුණු 4)**

**iii.** **පහත දැක්වෙන්නේ වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ 2 කි.**

**Qd = 600 – 10PQs = 10 P**

**අ)** **වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්තාර කඩදාසියක ඇඳ දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය ලකුණු කර දක්වන්න.** **(ලකුණු 2)**

**ආ)** **සමතුලිත මිලේදී පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න.** **(ලකුණු 2)**

**ඇ)** **සමතුළිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න.** **(ලකුණු 2)**

**ඈ)** **ප්‍රමාණය 200 දී අධි ඉල්ලුම් මිල කොපමණද?** **(ලකුණු 2)**


**iv.** **වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර විතැන් වීමෙන් වෙළඳපොළ සමතුලිත මිල අඩුවිය හැකි අවස්ථා දෙකක් හා වැඩිවිය හැකි අවස්ථා දෙකක් දක්වන්න.** **(ලකුණු 4)**

04). i. - යෙදවුම්වල මිල - සම්බන්ධිත භාණ්ඩ මිල - තාක්ෂණය - අපේක්ෂිත අනාගත මිල - රාජ්‍ය ප්‍රතිපත්ති (බදු සහනාධාර) - සැපයුම් කරුවන්ගේ සංඛ්‍යාව (ලකුණු 4)

ii.
- අපේක්ෂිත ඉල්ලුම් මිල සහ අපේක්ෂිත සැපයුම් මිල සමාන විය යුතුය.
- අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය ශුන්‍ය විය යුතුයි.
- අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශුන්‍ය විය යුතුයි.
- පාරිභෝගික පැහැදම හා නිෂ්පාදන අය භාරය සමාන විය යුතුය. (ලකුණු 4)

- ආර්ථික අතිරික්තය උපරිම වීම (නිෂ්පාදක හා පාරිභෝගික අතිරික්තය බිහිවීම)
- ආර්ථිකයේ සම්පත් භාවිතය කාර්යක්ෂම වීම

iii. අ)




Qd = Qs

600 – 10P = 10P

600 = 20P

$P = \frac{600}{20}$ $\underline{\underline{= 30}}$

Qs = 10 x 30 $\underline{\underline{= 300}}$

(නිවැරදි රූප සටහනට ල. 1, සමතුලිත මිල හා ප්‍රමාණයට , ල.1)

ආ) පාරිභෝගික අතිරික්තය = (උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල ) x සමතුලිත ප්‍රමාණය / 2

$$= \frac{(60-30)x\,300}{2}$$

$$= \frac{30\,x\,150}{2} \quad = \quad 4500//$$ (ලකුණු 1)

නිෂ්පාදන අතිරික්තය = (සමතුලිත මිල - අවම සමතුලිත මිල ) x සමතුලිත ප්‍රමාණය / 2

$$= \frac{30-0}{2}\,x\,300$$

$$= \frac{30}{2}\,x\,300 \quad = \quad 4500//$$ (ලකුණු 1)

ඇ) $PED = \quad b\,x\,\frac{P}{q} \qquad = \quad -10\,x\,\frac{30}{300} \qquad \underline{\underline{= -1}}$ (ලකුණු 2)

ඈ) ප්‍රමාණය 200 දී අධි ඉල්ලුම් මිල

ඉල්ලුම් මිල Qd - Qs

Qd = 600 – 10P – (10 P)

200 = 600 – 10P – 10 P

20P = 600 - -200 $\qquad P = \frac{\not{4}00}{2\not{0}}$ $\underline{\underline{= 20}}$ (ලකුණු 2)

(ඉල්ලුම හා සැපයුම වෙනම ගණනය කර ඉල්ලුම් මිලෙන් සැපයුම් මිල අඩු කර තිබුණත් ලකුණු 2 හිමිවේ.)

iv. **සමතුලිත මිල අඩුවන අවස්ථා**

- ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වන වේගයට වඩා වැඩි වේගයකින් සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම.
- ඉල්ලුම් වක්‍රය වමට විතැන්වන වේගයට වඩා අඩු වේගයකින් සැපයුම් වක්‍රය වමට විතැන්වීම

**සමතුලිත මිල වැඩිවන අවස්ථා**

- ඉල්ලුම් වක්‍රය දකුණටත් සැපයුම් වක්‍රය වමටත් විතැන්වීම
- ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වන වේගයට වඩා අඩු වේගයකින් සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම.
- සැපයුම් වක්‍රය වමට විතැන්වන වේගයට වඩා අඩු වේගයකින් ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීම

(එක් කොටසකින් කරුණු 2 බැගින් කරුණු 4 ට ලකුණු 4)

**05). i. පහත සඳහන් අවස්ථාවලදී මුළු අයභාරය වැඩිවේද? අඩුවේද? නැතහොත් නොවෙනස්ව පවතී ද යන්න සඳහන් කරන්න.**

**අ)අනම්‍ය ඉල්ලුමකදී මිල පහළ වැටීම**

**ආ) නම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යාම**

**ඇ) අනම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යාම**

**ඈ) අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයක මිල අඩුවීම.**

**ඉ) ඒකීය නම්‍ය ඉල්ලුමකදී මිල පහළ වැටීම** **(ලකුණු 1 x 5)**

**ii. තරගකාරී තේ වෙළඳපොළක් ඇසුරෙන් පහත සඳහන් සිදුවීම්වල ප්‍රතිවිපාක සුදුසු රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.**

**අ)දිලීර රෝගයක් හේතුකොට ගෙන තේ වතු විශාල ප්‍රමාණයක් විනාශ වීම.**

**ආ) තේ සඳහා පාරිභෝගික අභිරුචිය අඩුවීම.**

**ඇ) කෝපි වෙළඳපොළ මිල පහළ වැටීම.**

**ඈ) තේ සඳහා දියුණු තාක්ෂණයක් හඳුන්වාදීම**


**ඉ) තේ වතු හිමියන් ලබාගත් වගාණය කපා හැරීම** **(ලකුණු 2 x 5)**

**iii. පාරිභෝගිකයන්ට, නිෂ්පාදකයන්ට ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රායෝගික වශයෙන් සැපයුම් නම්‍යතා සංකල්පය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.** **(ලකුණු 5)**

05). i. අ) මුළු අයභාරය අඩුවේ ආ) මුළු අයභාරය අඩුවේ. ඇ) මුළු අයභාරය වැඩිවේ


ඈ) මුළු අයභාරය වැඩිවේ ඉ) මුළු අයභාරය වෙනස් නොවේ. (ලකුණු 5)

ii. අ) තේ වතු විනාශ වීම නිසා තේ වෙළඳපොළ සැපයුම් වක්‍රය වමට විතැන් වේ. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබුණොත් සමතුළිත මිල ඉහළ යන අතර ප්‍රමාණය අඩුවේ. (ල.01)





(නිවැරදි රූප සටහනකට ල. 01)

ආ) තේ සඳහා පාරිභෝගික අභිරුචිය අඩුවීම නිසා
- වෙළඳපොල ඉල්ලුම් වක්‍රය වමට විතැන්වේ.
- අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී සමතුළිත මිල අඩුවන අතර, සමතුළිත ප්‍රමාණයද අඩුවේ. (ල.1)





(නිවැරදි රූප සටහනකට ල. 01)

ඇ) තේ සහ කෝපි ආදේශන භාණ්ඩ බැවින් කෝපි මිල පහළ වැටීම නිසා මෙතෙක් තේ පරිභෝජනය කළ පිරිස කෝපි පරිභෝජනයට පෙළඹීම නිසා වෙළඳ පොල තේ ඉල්ලුම් වක්‍රය වමට විතැන්වේ. (ල.1)
- වෙළඳපොල ඉල්ලුම් වක්‍රය වමට විතැන්වේ.
- අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී සමතුළිත මිල අඩුවන අතර, සමතුළිත ප්‍රමාණයද අඩුවේ. (ල.1)





ඈ) තේ සඳහා දියුණු තාක්ෂණයක් හඳුන්වාදීම නිසා තේ නිෂ්පාදනය වැඩිවී වෙළඳපොල තේ සැපයුම වැඩිවේ. එවිට තේ සැපයුම් වක්‍රය දකුණට විතැන්වේ. සමතුළිත මිල අඩුවන අතර, ප්‍රමාණය වැඩිවේ. (ල.1)




(නිවැරදි රූප සටහනකට ල. 01)

ඉ) තේවතු හිමියන් ලබාගත් වගා ණය කපා හැරීම නිසා තේ නිෂ්පාදනයට යොදවන පහසුකම් වැඩිකිරීමට හැකිවේ. එවිට නිෂ්පාදනය වැඩි වී වෙළඳපොළ තේ සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ. තේ මිල අඩුවේ. අලෙවි ප්‍රමාණය වැඩිවේ. (ල.1)




(නිවැරදි රූප සටහනකට ල. 01)

iii. - භාණ්ඩයක මිල වෙනස්වන විට පාරිභෝගික පැහැදම /නිෂ්පාදන අයභාරයට කෙරෙන බලපෑම පුරෝකථනය කළ හැකිවීම.
- තම නිෂ්පාදන සඳහා ආදායම උපරිම කෙරෙන ආකාරයට මිලක් තීරණය කළ හැකිවීම.
- ව්‍යාපාර ආයතනයකට ඇති ඒකාධිකාරී ශක්තිය නිශ්චය කළ හැකි වීම.
- යම් භාණ්ඩයක් සඳහා පවතින ආදේශන හා අනුපූරක භාණ්ඩ කවරේද යන්න හඳුනා ගැනීම.
- සාධක සංචලන හැකියාව හඳුනාගත හැකිවීම. (කරුණු 5 ට ලකුණු 5)

## ආ කොටස

**06). සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සමීකරණ වලින් පෙන්නුම් කරයි.**

**Qd = 300 – 10p Qs = -100 + 10P**

**i. මෙම වෙළඳපොලේ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)**

**ii. රජය මෙම භාණ්ඩය මත ඒකකයකට රු. 4 ක් වන සේ දේශීය භාණ්ඩ බද්දක් නිෂ්පාදකයන් මත පනවනවා යැයි සිතන්න.**

**අ) බදු පැනවීමෙන් පසු පාරිභෝගික අතිරික්තය කොපමණද? (ලකුණු 2)**

**ආ) දේශීය භාණ්ඩ බද්දෙන් රජය එකතු කරනු ලබන අයභාරය කොපමණද? (ලකුණු 2)**

**ඉ) පාරිභෝගිකයා දරන මුළු බදු මුදල කොපමණද? (ලකුණු 2)**

**iii. ''බද්දක් අයකිරීම මෙම වෙළඳපොළේ සම්පත් බෙදාවෙන් කිරීමේ අකාර්යක්ෂමතා බිහි කරයි''. මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**iv. ගැනුම්කරුවන් මත අලෙවි බද්දක් (ඒකක බදු) පැනවීමෙන් පසුව බදුබර බෙදීයන ආකාරය යෝග්‍ය ප්‍රස්ථාර සටහනකින් පෙන්වා දෙන්න. (ලකුණු 4)**

**v. නිෂ්පාදන සලාක නියම කිරීම යන්නෙන් කවරක් අදහස් වේද? සලාක නියම කිරීමේ අරමුණ කුමක්ද? (ලකුණු 4)**

06). i. සමතුලිත මිල හා ප්‍රමාණය

Qd = Qs

300 – 10P = -100+10P

400 = 20P 20 =P (ල.1)

Qd = 300 – 10(20)

= 300 – 200 = 100 (ල.1)

ii. අ) පසු පාරිභෝගික අතිරික්තය = (උපරිම ඉල්ලුම් මිල - නව සමතුලිත මිල) x නව සමතුලිත ප්‍රමාණය / 2

$= \frac{(30-22)}{2}$ x 80 (ල.1) = රු. 320 (ල.1)

නව සමතුලිත මිල

Qs = -100 + 10(P – 4)

= -100 + 10P – 40

Qst = 140 + 10P

- 140 + 10P = 300 -10P

20P = 300 + 140

P = $\frac{440}{20}$ = 22

උපරිම ඉල්ලුම් මිල සෙවීම

0 = 300 - 10P

10 P = 300

= $\frac{300}{10}$ = 30

නව සමතුලිත ප්‍රමාණය 300 – 10 x 22 = 80

ආ) රජයේ බදු අයභාරය = ඒකක බද්ද x නව සමතුලිත ප්‍රමාණය

= රු. 4 x 80 (ලකුණු 1) = රු. 320 (ල.1)


ඉ) ඒකකයකට පාරිභෝගිකයා දරන බද්ද x නව සමතුලිත ප්‍රමාණය

රු. 2 x 80 = රු. 160 (ල.2)

iii. එකඟ වේ.

- නිෂ්පාදන බද්දක් පැනවීම නිසා සැපයුම් වක්‍රය ඒකක බද්දේ ප්‍රමාණයෙන් වමට විතැන් වේ.
- එවිට නිෂ්පාදනය අඩු වන බැවින් ආන්තික ප්‍රතිලාභ (MB) ආන්තික පිරිවැය (MC) ඉක්මවා යයි. (MB>MC)
- මෙම වෙළෙඳපොලේ නිෂ්පාදනයේ ආන්තික පිරිවැය භාණ්ඩයේ මිලට වඩා අඩුවේ. MC<P වේ.
- P>MC බැවින් බදු හේතුකරගෙන ඌන නිෂ්පාදනයක් වෙලෙඳපොළේ හටගන්නා නිසා මෙම වෙළඳපොළේ සම්පත් බෙදා වෙන්කිරීම අකාර්යක්ෂම වේ. $P \neq MC \neq MB$ (කරුණු 1 ට ල.1 බැගින් ල. 4)

iv.




a b දුරින් බද්දේ ප්‍රමාණය පෙන්නුම් කරයි.

$P_3$ → පාරිභෝගිකයා බද්දෙන් පසු ඒකකයකට ගෙවන මිල

$P$ → බද්දෙන් පසු නිෂ්පාදකයා ඒකයට ලබන මිල

ගැනුම් කරුවා මත බද්ද පනවනු ලැබුවද බදු බර පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර බෙදී ගොස් ඇත. (ල.2)

(රූප සටහනට ල.2)

v. - නිෂ්පාදන සලාක නියම කිරීම යන්නෙන් අදහස් කෙරෙන්නේ කිසියම් භාණ්ඩයක් කිසියම් නිශ්චිත කාලයක් තුළ නිපදවිය හැකි උපරිම නිමැවුම් ප්‍රමාණය පිළිබඳ සීමාවක් ආණ්ඩුව විසින් නියම කිරීමයි. (ල. 2)

- වගාකරුවන්ගේ ආදායම් ස්ථායිකිරීම සඳහා වෙළෙඳපොලට ළගාවන සැපයුම සීමා කරමින් මිල ඉහළ මට්ටමක පවත්වාගෙන යාම මෙහි ඇරමුණවේ. (ලකුණු 2)

**07). i. වෙළඳපොළ ක්‍රමයට මැදිහත් වී රජය විසින් සිදුකරන මිල පාලන ප්‍රතිපත්ති වල ස්වරූප පැහැදිලි කරන්න.(ලකුණු 4)**

**ii. සඵල උපරිම මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 5)**

**iii. උපරිම මිල පාලනය වෙනුවට නිෂ්පාදනය කරනු ලබන සෑම භාණ්ඩ ඒකකයක් සඳහාම නිශ්චිත සහනාධාරයක් ලබා දෙන්නේ නම් සහනාධාරයෙන් පසු හටගන්නා ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 4)**

**iv. වෙළඳපොලේ අලෙවිවන කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා විශේෂිත නිෂ්පාදන සහනාධාරයක් ලබාදුන් විට සහනාධාරයේ මුළු වාසිය නිෂ්පාදකයාට හිමිවන්නේ කුමන සැපයුම් නම්‍යතා තත්ත්වයක් යටතේද? රූප සටහනකින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 3)**


**v. මූලික ආහාර ද්‍රව්‍ය වල මිල ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා තොග රැස් කිරීම හා බෙදා හැරීම සිදුකරයි. එහි වාසි අවාසි සඳහන් කරන්න. (ලකුණු 4)**

07). i. ස්වරූප දෙකකි.

1. උපරිම මිල සීමා නියම කිරීම 2. අවම මිල සීමා නියම කිරීම (ලකුණු 2)

- ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වූ වෙළඳපොල මිල නිෂ්පාදකයින්ට අසාධාරණ වෙතැයි යන විශ්වාසය මත නිෂ්පාදකයාට සාධාරණය සැලසීම සඳහා රජය විසින් සමතුලිත මිලට වඩා ඉහළින් නිත්‍යානුකූලව නියමකරන මිල අවම මිල සීමාව වේ. (ල.1)
- උපරිම මිල සීමානියම කිරීම යනු වෙළඳපොල යාන්ත්‍රණයට යටතේ නියම වූ සමතුලිත මිල පාරිභෝගිකයාට අසාධාරණ වෙතැයි සිතූ විට ඔවුන්ට සාධාරණත්වය සැලසීම සඳහා රජය නියම කරන නීත්‍යානුකූල මිලයි. එය සමතුලිත මිලට වඩා පහළ මිලකි. (ල. 1)

ii.




(රූප සටහනට ලකුණු 2)

**ප්‍රතිවිපාක**

$Q_2 - Q_3$ ප්‍රමාණයේ අධි ඉල්ලුමක් හටගැනීම (භාණ්ඩ හිඟයක්)

$P_2$ මිලට වඩා වැඩි මිලකට භාණ්ඩය අලෙවි වීම හෙවත් කළුකඩ මිලක් හට ගැනීම. උපරිම කලුකඩ මිල $P_3$ මගින් නිරූපණය වේ.


පාරිභෝගික අතිරික්තය වැඩිවීම

(ඕනෑම උපරිම මිල පැනවීමේ ප්‍රතිවිපාකයකට ල. 1 බැගින් කරුණු 3 ට ලකුණු 3)

iii. - සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ. සැපයුම වැඩිවේ.

- වෙළඳපොළ මිල පහළ යයි. - රජයට පිරිවැයක් දැරීමට සිදුවේ.
- සමාජ ශුභ සාධනයට අහිතකර බලපෑම් ඇතිවේ.
- සම්පත් බෙදා වෙන් කිරීමේ අකාර්යක්ෂමතා හටගනී. (MC > 7P වේ) (කරුණකට 1 බැගින් ලකුණු 4)

iv.




සැපයුම පූර්ණ අනම්‍ය වන විට ඒකක සහනාධාරය හේතුකරගෙන සැපයුම් වක්‍රයෙහි වෙනසක් හටනොගනී. එබැවින් සහනාධාරයට පෙර හා පසු සමතුලිතයෙහි කිසිදු වෙනසක් සිදුනොවන බැවින් සහනාධාරයේ මුළු වාසිය නිෂ්පාදකයාට හිමිවේ.
(රූපසටහනට ල. 1 පැහැදිලි කිරීමට ල. 2)

v. **වාසි** - ගොවීන්ගේ ආදායම් ස්ථාවර වීම - එම භාණ්ඩ සඳහා ප්‍රාග්ධන ආයෝජන ධෛර්ය මත් වීම
- යැපුම් කෘෂි කර්මාන්තය ශක්තිමත් වීම - පාරිභෝගිකයාට හිතකර වීම

**අවාසි** - අධි සැපයුම මිලදී ගැනීමට විශාල පිරිවැයක් දැරිය යුතුවීම - අධි නිෂ්පාදනයක් බිහිවීම
- ආරම්භක ප්‍රාග්ධනය විශාල ප්‍රමාණයක් අවශ්‍ය වීම
- ගබඩා ගාස්තු පිරිවැය හා පරිපාලන වියදම අධික වීම (වාසි 2 ට ල. 2 අවාසි 2 ලකුණු 2)

**08). තරඟකාරී වෙළඳපොළක අලෙවි වන X භාණ්ඩයේ වෙළඳපොළ සමතුලිත මිල හා එම මිලට අලෙවි වන සමතුලිත ප්‍රමාණය පිළිවෙලින් රු. 40 සහ ඒකක 80 කි. භාණ්ඩයේ මිල රු. 30 ක් වන විට උපරිම ඉල්ලුම් ප්‍රමාණය 100 ක් වන අතර, අවම සැපයුම් ප්‍රමාණය ඒකක 60 කි. රජය විසින් මෙම භාණ්ඩ ඒකකයකට රු. 50 ක් වන සේ අවම මිලක් නීතියෙන් නියම කර තිබේ යැයි සලකන්න.**

**i.** **මෙම තොරතුරු රූප සටහනකින් ඉදිරිපත් කරන්න.** **(ලකුණු 5)**

**ii.** **අවම මිල හඳුන්වා දීමෙන් පසු වෙළඳපොල තුළ හටගන්නා අධි සැපයුම් ප්‍රමාණය කොපමණද?** **(ලකුණු 2)**


**iii.** **අධි සැපයුම මිලදී ගැනීම මගින් අවම මිල පවත්වා ගෙන යාමට ආණ්ඩුව කටයුතු කරනු ලැබුවහොත් ආණ්ඩුවට දැරීමට සිදුවන පිරිවැය කොපමණද?** **(ලකුණු 2)**

**iv.** **අධි සැපයුම මිලදී ගැනීම වෙනුවට ඌන පූර්ණ ගෙවීම් ක්‍රමයක් යටතේ අවම මිල සහතික කරයි නම් ඒකකයක් වෙනුවෙන් රජය දරන පිරිවැය කොපමණ වේද?** **(ලකුණු 2)**

**v.** **අවම මිල සහතික කිරීම සඳහා ආණ්ඩුව විසින් ගනු ලබන මිල ආධාරක ස්වරූප දෙකෙන් සමාජ ශුභ සාධනයට වැඩිම අහිතකර බලපෑමක් ඇතිකරන්නේ කුමන ස්වරූපය මගින්ද? ඔබේ රූප සටහන ඇසුරින් පෙන්වා දෙන්න.(ලකුණු 5)**

**vi.** **ගොවීන්ගේ ආදායම් ස්ථාවරත්වයට පත් කිරීම සඳහා රජයකට ගතහැකි ක්‍රියාමාර්ග කවරේද?** **(ලකුණු 4)**

08). i.




ඉල්ලුම් හා සැපයුම් වක්‍ර නිවැරදිව ඇඳීමට (ල.4)
අවම මිල ලකුණු කිරීම (ල.1)

ii. රු. 50 දී සැපයුම් ප්‍රමාණය - ඉල්ලුම් ප්‍රමාණය = අධි සැපයුම
100 - 60 = ඒකක 40 (ලකුණු 2)

iii. ආණ්ඩුවේ පිරිවැය = රු. 50 x ඒකක 40 = රු. 2000 (ලකුණු 2)

iv. ඒකකයක් වෙනුවෙන් රජය දරන පිරිවැය = රු. 20.00 (ලකුණු 2)

v. ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය යටතේ අහිමි වන සමාජ ශුභ සාධනය K (ලකුණු 2)
අධි සැපයුම රජය මිලදී ගැනීම නිසා අහිමිවන සමාජ ශුභ සාධනය B+G+F+I+J+E+K (ල. 2)
- සමාජ ශුභ සාධනයට සැලකිය යුතු ප්‍රමාණයක අහිමි වීමක් ඇතිකරන්නේ සාපේක්ෂව අධි සැපයුම රජය මිලදී ගැනීමේ සහතික මිල ක්‍රමය මගිනි. (ල. 1)

vi. - නිෂ්පාදන සලකා ලබාදීම - ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම
- අවම මිල ප්‍රතිපත්තිය - සහතික මිල ක්‍රමය - භූමිය වගාවට යොදා නොගැනීම සානුබල ලබාදීම
- අපනයන සඳහා සහනාධාර ලබාදීම - ඌණ පූර්ණ ගෙවීම් ක්‍රම (කරුණු 4 ට ලකුණු 4)
-

**09). i. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය හඳුන්වාන්න. (ලකුණු 4)**
**ii. ආයතනයක දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහළ බැසීමට බලපාන හේතු කවරේද? (ලකුණු 4)**
**iii. කෙටි කාලයෙහි නිෂ්පාදනයේ නිරත වී සිටින ආයතනයක නිමැවුම ප්‍රසාරණය කරන විට සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍ර හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**iv. නිශ්චිත දිනකට, කිසියම් නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන පිරිවැය හා අයභාරය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.**

| අයිතමය | රුපියල් |
|---|---|
| ආයතනයේ අයභාරය | 24000 |
| වැටුප් හා වේතන | 15000 |
| අමුද්‍රව්‍ය වියදම | 4000 |
| ආර්ථික ක්ෂය වීම් | 200 |
| රක්ෂණ වාරිකය | 100 |
| බදු කුලිය | 1000 |
| බැංකු ණය සඳහා පොලී ගෙවීම් | 1200 |
| හිමිකරු යොදන ලද ප්‍රාග්ධනයෙහි අහිමි වූ පොලී | 500 |
| අහිමි වූ වැටුප් ආදායම | 800 |

**මෙම තොරතුරු වලට අනුව මෙම ආයතනයේ අදාළ දිනයේ දී,**
**අ) සෘජු පිරිවැය ගණනය කරන්න. ආ) මුළු ආවස්ථික පිරිවැය කොපමණද?**
**ඉ) ගණකාධිකාරී ලාභය කොපමණ වේද? උ) ආර්ථික ලාභය ගණනය කරන්න.(ල.2 බැගින් මුළු ල.8)**

09). i. - කර්මාන්ත ශාලාවේ ධාරිතාව හා නිෂ්පාදන ශිල්පක්‍රමය නොවෙනස්ව තිබියදී විචල්‍ය යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනය සිදුකරන විට යෙදවුම් හා නිමැවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් පෙන්නුම් කෙරේ.
- කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය $Q = f(V_1, V_2, V_3, \dots \dots V_n, K)$ (ලකුණු 2)
- නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ සියලු යෙදවුම් වෙනස් කරන විට යෙදවුම් හා නිමැවුම් අතර පවතින තාක්ෂනික සම්බන්ධතාව දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් පෙන්නුම් කරයි.
- දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය $Q = f(V_1, V_2, V_3, \dots \dots V_n, K_1, K_2, K_3)$ (ලකුණු 2)

ii. දිගුකාලයේදී නිෂ්පාදන ආයතනයක සාමාන්‍ය මුළු පිරිවැය පහළ වැටීමට හේතුව පරිමාණානුකූල පිරිමැසුම් අත්කර ගැනීමයි. (ලකුණු 1)
පරිමාණානුකූල පිරිමැසුම් හට ගැනීමට හේතු
- ධාරිතාව විශාල වීම නිසා හටගන්නා තාක්ෂණික පිරිමැසුම් - කළමනාකරණ පිරිමැසුම්
- අලෙවිකරණ පිරිමැසුම් - මූල්‍යමය පිරිමැසුම - අවදානම් දැරීම සම්බන්ධ පරිමාණානුකූල පිරිමැසුම්
(කරුණකට ල. 1 බැගින් කරුණු 3 ට ලකුණු 3)

iii. - සාමාන්‍ය විචල්‍ය පිරිවැය යනු මුළු විචල්‍ය පිරිවැය නිමැවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අගයයි. සාමාන්‍ය මුළු පිරිවැය යනු සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය ස්ථාවර පරිවැය යන පිරිවැය සංරචක දෙකෙහි එකතුවයි.
- නිමැවුම ප්‍රසාරණය කරන විට සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හා සාමාන්‍ය විල්‍ය පිරිවැය වක්‍රය ක්‍රමයෙන් පහළ බැස නැවතත් ඉහළයයි. වක්‍ර දෙකට ඉංග්‍රීසි U අකුරක හැඩය ගනී.
- සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ඉහළින් සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය ගමන් කරන අතර වක්‍ර දෙක අතර සිරස් දුර මගින් සාමාන්‍ය ස්ථාවර පිරිවැය නිරූපණය කරයි.
- නිමැවුම ප්‍රසාරණය වනවිට සාමාන්‍ය මුළු පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය මත කිසිවේටෙකත් පතිත නොවන අයුරින් සමීපව ගමන් කරයි. (වක්‍ර දෙක අතර සිරස් දුර ක්‍රමයෙන් අඩුවේ.)
- සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යය පිහිටන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයෙහි අවම ලක්ෂ්‍යයට ඉහළිනි. (කරුණු 4 ට ලකුණු 4)

iv. අ) ඍජු පිරිවැය = වැටුප් හා වේතන 15000
අමුද්‍රව්‍ය වියදම 4000
රක්ෂණ වාරිකය 100
බදු කුළිය 1000
පොලී ගෙවීම් 1200
රු. 21300 (ල. 2)

ආ) මුළු ආවස්ථික පිරිවැය = ඍජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 21300 + (200 + 500 + 800)
= රු. 22800 (ල. 2)

ඉ) ගණකාධිකාරී ලාභය = මුළු අයභාරය - ඍජු පිරිවැය
= රු. 24000 - 21300
= රු. 2700 (ල. 2)

උ) ආර්ථික ලාභය = මුළු අයභාරය - මුළු ආවස්ථික පිරිවැය
= රු. 24000 - 22800
= රු. 1200 (ල. 2)

**10). i. නිෂ්පාදන ආයතනයක් කෙටිකාලයේදී ලබන එල නිර්වචනය කරන්න. ඒ සඳහා පදනම් කරගන්නා උපකල්පන කවරේද? (ලකුණු 4)**

**ii. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ මුළු නිමැවුම, සාමාන්‍ය නිමැවුම හා ආන්තික නිමැවුම අතර කවර සබඳතාවක් පවතින්නේද? යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 4)**

**iii. පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමාණුකූල නොපිරිමැසුම් යනු කවරේද? (ලකුණු 4)**

**iv. වෙළෙඳපොළ ආකෘති අතර විවිධත්වයක් ගැනීම කෙරෙහි බලපාන සාධක සඳහන් කරන්න. (ලකුණු 4)**

**v. අවශේෂ වෙළඳපොළ ව්‍යුහ හා සැසඳීමේදී පූර්ණ තරගකාරී ආයතනයේ ඉල්ලුම් වක්‍රයේ සුවිශේෂී හැඩය හා ඒ කෙරෙහි බලපා ඇති සාධක නම් කරන්න. (ලකුණු 4)**

10). i. - ස්ථාවර යෙදවුමක් සමඟ මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් වැඩි වැඩියෙන් භාවිත කරන විට, විචල්‍ය යෙදවුමේ ආන්තික නිෂ්පාදිතය හා සාමාන්‍ය නිෂ්පාදිතය එක්තරා අවස්ථාවකට පසු අඩු වීමට පටන් ගැනීම හීනවන ඵලදාවයි. (කෙටි කාලයේදී හීනවන ආන්තික ඵල ලබයි. (ල.2)

උපකල්පන : 1. සියලු විචල්‍ය යෙදවුම් ඒකකක සමජාතීය වීම
2. අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ තාක්ෂණය ස්ථාවරව පැවතීම. (ල.2)

ii. - මුළු නිමැවුම යනු ස්ථාවර යෙදවුම් සමඟ විචල්‍ය යෙදවුම් මිශ්‍ර කරමින් නිෂ්පාදනයේ යෙදෙන විට ලැබෙන නිමැවුමයි. සාමාන්‍ය නිෂ්පාදිතය යනු විචල්‍ය යෙදවුම් ඒකකයකට සාමාන්‍යයෙන් ලැබෙන නිමැවුම් ප්‍රමාණයයි. විචල්‍ය යෙදවුම් එක් ඒකකයකින් වෙනස් කරන විට මුළු නිමැවුමට අලුතින් එකතුවන නිමැවුම ආන්තික නිැවුමයි.
- මුළු නිෂ්පාදිතය වැඩිවන වේගයෙන් ඉහළ නගින විට සාමාන්‍ය නිමැවුම හා ආන්තික නිමැවුම ඉහළ යයි. MP උපරිම වේ.
- මුළු නිමැවුම අඩුවන වේගයකින් ඉහළ නගින විට ආන්තික නිෂ්පාදිතය සාමාන්‍ය නිෂ්පාදිත වක්‍රයේ උපරිම ලක්ෂ්‍යය ඡේදනය කරමින් වේගයෙන් පහළට ගමන්කරයි.
- මුළු ඵලදාව උපරිම වන විට ආන්තික ඵලදාව ශුන්‍ය වේ. සාමාන්‍ය ඵලදාව පහළ බසියි.
(කරුණකට ල.1 බැගින් ලකුණු 4)

iii. - පරිමාණානුකූල පිරිමැසුම් යනු දිගුකාලයේදී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමේදී ආයතනයේ සාමාන්‍ය පිරිවැය පහළ බැසීමයි.
- ආයතනයක ධාරිතාව පුළුල් කිරීමක් සමඟ නිෂ්පාදන යෙදවුම් වල මිල පහළ වැටීමත් නිසා අත්කරගත හැකි මූල්‍ය ප්‍රතිලාභයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් හැඳින්විය හැක. (ල. 2)
- පරිමාණානුකූල නොපිරිමැසුම් යනු දිගු කාලයේදී ආයතනයක් නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමේදී ආයතනයේ සාමාන්‍ය පිරිවැය ඉහළ යාමයි. එනම් නිෂ්පාදන සාධක වල කාර්යක්ෂමතාව පහළ යාම නිසා හටගන්නා මූල්‍යමය වශයෙන් වන පාඩුවයි. (ල. 2)

iv. - වෙළඳපොළ තුළ සිටින ආයතන සංඛ්‍යාව - නිෂ්පාදිතයේ ස්වභාවය / සමජාතීය බව
- අබාධ ප්‍රවේශය හා පිටවීමේ හැකියාව - ආයතන අතර පවත්නා තරගයෙහි ස්වභාවය (ලකුණු 4)

v. - අවශේෂ ආයතන වල ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වන අතර, පූර්ණ තරගකාරී ආයතනයේ ඉල්ලුම් වක්‍රය (පූර්ණ නම්‍ය ) තිරස් අක්ෂයට සමාන්තරව පිහිටයි (ල.1)

**එසේ වීමට හේතු**

1. නිෂ්පාදිතය සමජාතීය වීම
2. වෙළෙඳපොළ සැපයුමෙන් ආයතනයේ සැපයුම අතිශයින් නොවැදගත් ප්‍රමාණයක් වීම
3. වෙළෙඳපොළ පිළිබඳ පූර්ණ දැනුම (ලකුණු 3)



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440